**ජාත්‍යන්තර පාසල් පුස්තකාලයාධිපතීන්ගේ සංගමය** International Association of School Librarianship (IASL) **මඟින් ප්‍රකාශයට පත් කරන ලද වෘත්තීය පුවත්පතක්** (Professional Journal ) **වන** 'School Libraries Worldwide' **හි පල කරන ලද ලිපියක් පරිවර්තනය කිරීම.**




**පාසල් පුස්තකාල කමිටු 2018/2019, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය**

**කැඳවුම්කරු : ඩී. ආර්. චන්දිමා දිසානායක මිය**

email : chandimadiss5@gmail.com

**උපදේශන සහාය : උපාලි අමරසිරි මයා**


**Title**

**'Australia's Professional Excellence Policy: Empowering School Libraries'** by Pru Mitchelle. In Vol. 12, No. 1, January 2006, pp. 39-49

සිංහල පරිවර්තනය - Sinhalese Translation
ඩබ්ලිව්. ආර්. ගාමිණී ද සිල්වා [B.A. (Ceylon), MALIS (Monash), A.L.A. (London), F.L.A. (London), FSLLA] විසින් සිංහලට පරිවර්තනය කරන ලදී.

## ඕස්ට්‍රේලියාවේ වෘත්තීය විශිෂ්ටත්ව ප්‍රතිපත්ති : පාසල් පුස්තකාල සවිබල ගැන්වීම


**පෘ මිචෙල්**

**ඇඩිලේඩ් විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව**



ඕස්ට්‍රේලියානු අධ්‍යාපනයේ සියලු අංග වර්තමානයේ උත්සාහ කරනුයේ ගුණාත්මක ඉගැන්වීම නිර්වචනය කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමටත් ගුරුවරුන්ගේ ගුණාත්මකභාවය සහ අධ්‍යාපනික නායකත්වය සංවර්ධනය කිරීමටත්ය. ඉගැන්වීම පිළිබඳ වෘත්තීය ප්‍රමිති සඳහා වන ජාතික රාමුව ඵලදායී ඉගැන්වීම පිළිබඳ පිළිගත් පදනම් අංග සහ මානයන් පැහැදිලි කරන අතර විශේෂිත, විශේෂඥ සහ විෂය ක්ෂේත්‍රයට නියත වූ වෘත්තීය ප්‍රමිති සංවර්ධනය කිරීමේ දී සැලැස්මක් සපයයි. 2005 දී ඕස්ට්‍රේලියානු පාසල් පුස්තකාල සංගමය (ASLA) සහ ඕස්ට්‍රේලියානු පුස්තකාල සහ තොරතුරු සංගමය (ALIA) ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා වෘත්තීය විශිෂ්ටත්වයේ ප්‍රමිති නමින් සම ප්‍රකාශනයක් නිකුත් කර ඇත. මෙය වෘත්තීය ඉගැන්වීම් න්‍යාය පත්‍රය තුළ තමන්ගේ ස්ථානය සොයා ගැනීමට ගුරු පුස්තකාලයාධිපතීන්ට සහාය වන ලේඛනයකි. ALIA සහ ASLA ලේඛනයෙන් ශක්තිය සපයන ප්‍රතිපත්ති රාමුව මෙම ලිපියෙන් සාරාංශ කෙරෙන අතර ගුරු පුස්තකාලයාධිපතීන්ට තම වෘත්තීය ව්‍යවහාරය ඇගයීමට උදව් කිරීම මගින් මෙම ව්‍යාපෘතිය පාසල් පුස්තකාල සවිබල ගැන්වීමට උත්සාහ කරන ආකාරය පෙන්වා දෙයි.


මා මෙම ලිපිය ආරම්භ කරනුයේ ගුණාත්මක අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් මතු කර දක්වමින් ඕස්ට්‍රේලියාවේ අධ්‍යාපනය හරහා ලුහුඬු ''අනාවරණ චාරිකාවක් '' සමඟය. අනතුරුව මම

පාසල් පුස්තකාල මෙම දසුන වෙතට තෙමේම ගොඩ නංවා ඇති ආකාරයෙන් ගුණාත්මක ඉගැන්වීම සහ වෘත්තීය ප්‍රමිති පිළිබඳ මෙම ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයේ ප්‍රතිඵලයක් ලෙස අනාගත ඔස්ට්‍රේලියාව තුළ අප අපේක්ෂා කරන ප්‍රතිඵල කවරක් ද යන්නත් පෙන්වා දෙමි.

ඔස්ට්‍රේලියානු සංඛ්‍යා ලේඛන කාර්යාංශයට අනුව (2004) පාසල් 9615 ක පූර්ණකාලීන සිසුන් මිලියන 3.3 ක් ඉගෙනුම ලබන අතර 233065 ක පූර්ණකාලීන ගුරුවරුන් ඉගැන්වීමේ නිරත වෙති. ප්‍රාන්ත සහ කලාප ආණ්ඩු අටට පාසල් අධ්‍යාපනය සඳහා වගකීම පැවරීමට ඔස්ට්‍රේලියානු ව්‍යවස්ථාව (1901) කෙටුම්පත් කළවුන් ගත් තීරණයට ස්තුති වන්නට ව්‍යුහය, විෂයමාලා, ඇගයීම සහ ඉගැන්වීම් අතින් මෙම පාසල් සැලකිය යුතු වෙනස්කම්වලින් යුක්ත වේ. ඔස්ට්‍රේලියාවේ ප්‍රාන්තීය දේශසීමා හරහා ගමන් කරන ගුරුවරුන්ට සහ සිසුන්ට විෂයමාලාව මෙන් ම පාසල් යාම, අරමුදල් සැපයීම, සුදුසුකම් හා අත්දැකීම්වල සැහැල්ලුව යනාදියේ මට්ටම්වල අර්ථයෙන් වෙනත් රටකට යාමෙන් කවර වින්දනයක් ලැබිය හැකි ද යන්න අනාවරණය කර ගත හැකි වේ. කතෝලික සහ ස්වාධීන පාසල් අංශ ප්‍රාන්තීය හා කලාපීය ආණ්ඩු පාසල් පද්ධති (සිසුන්ගෙන් 30% සේවා සපයන) වසා පැතිරෙන විට මෙම දසුනෙහි සංකීර්ණත්වය වර්ධනය වේ. 24 කට වැඩි පරිපාලන ඒකක සියල්ල ම ස්වකීය වූ සුදුසුකම්, රැකියා සහ වෘත්තීය සංවර්ධන අවශ්‍යතා ගුරුවරුන් සඳහා සකසයි. ගුරුවරුන් ලියාපදිංචි කිරීමේ මණ්ඩල සමහර ප්‍රාන්තවල වසර ගණනාවක සිට ස්ථාපිත කර තිබුණ ද අනෙකුත් පද්ධතිවලට කිසිදු ලියාපදිංචියක් අවශ්‍ය වී නොමැත. පසුගිය වසර තිහ පුරා පංති කාමර ගුරුවරුන් සඳහා අධීක්ෂණයක් තිබුණේ නම් ඒ ඉතා අවම වශයෙනි. (Kleinhenz & Ingvarson, 2004) (PISA වැනි ජාත්‍යන්තර අධ්‍යයනයන්හි දී ඔස්ට්‍රේලියානු අධ්‍යාපන ක්‍රමයේ නිමවුමක් ලෙස මනින විට පවා ) මෙම නිරන්තර හෙළා දැකීම්, බණ්ඩනයන්, විවිධත්වය සහ ගුරුවරුන්ගේ වගකීමේ අඩුව දක්නට ලැබේ. (OECD, 2003, Thomson, Crosswell & de Bortol: 2004 වාර්තා කළ පරිදි) ඔස්ට්‍රේලියානු සිසුන් සිටිනුයේ නිරන්තරයෙන් ඉහළ ඇගයීමේ මට්ටමකය. ඔවුන් ගණිතයෙන් පසු වන්නේ පස්වන ස්ථානයේය. ඔවුනට ඉදිරියෙන් හොංකොංචීනය, ෆින්ලන්තය, කොරියාව සහ නෙදර්ලන්තය සිටී. විද්‍යාවෙන් ඔවුන් පසු වන්නේ සිව්වන ස්ථානයේ වන අතර ෆින්ලන්තය, ජපානය සහ කොරියාව පළමු ස්ථාන තුනට හිමිකම් කියයි. කියවීමෙන් ඔවුන් දෙවෙනි වන්නේ ෆින්ලන්තයට පමණි. ඔස්ට්‍රේලියානු සිසුන්ගේ සිසු ගුරු සබඳතාවේ නැඹුරුව OECD සාමාන්‍යයට වඩා ඉහළ බව වාර්තා වේ. සංගත ජාතික විෂයමාලා ක්‍රමයක්, ජාතික ගුරු ලියාපදිංචියක් හෝ ප්‍රාන්ත සියල්ල තුළ පාසල් යාමේ පොදු වයසක් නොමැතිව ගුණාත්මක අධ්‍යාපනයක් සාක්ෂාත් කර ගත හැකිය යන තර්කයට මෙවැනි ප්‍රතිඵල සහාය දක්වන බව දිස් වේ.

සැබැවින් ම, ප්‍රාන්ත හා කලාප ඔස්ට්‍රේලියාවේ අධ්‍යාපනය තනිව පාලනය කිරීම තවදුරටත් අවධානයට ලක් වන කරුණක් නොවේ. 1974 දී විශ්වවිද්‍යාලවලට අරමුදල් සැපයීම ජාතික රජය යටතට ගැණිනි. මෙම මූල්‍ය පාලනයත් සමඟ ප්‍රතිපත්ති මෙහෙයවීමට අවස්ථාවක් ඊට ලැබිණි. ඔස්ට්‍රේලියාවේ වත්මන් ගුණාත්මක අධ්‍යාපන න්‍යාය පත්‍රය සාමාන්‍යයෙන් සලකා බැලීම ආරම්භ කර ඇත්තේ 'උසස් අධ්‍යාපනයඃ 1990 දශකයේ ගුණාත්මක බව සහ විවිධත්වය' යන ලේඛනය සමඟ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේය. (Baldwin, 1991) ඔස්ට්‍රේලියානු උසස් අධ්‍යාපනයේ තත්ත්ව සහතිකය පිළිබඳ ප්‍රවර්ධනය, විගණනය සහ වාර්තා කිරීමසමඟ ස්වාධීන ජාතික ආයතනයක් බල ගැන්වීමක් ලෙස විශ්වවිද්‍යාල තත්ත්ව ආයතනයක් 2001 දී ස්ථාපිත කිරීම මීට ඇතුළත් විය. (ඔස්ට්‍රේලියානු විශ්වවිද්‍යාල තත්ත්ව ආයතනය

(AUQA), 2004) පාසල් පවත්නේ න්‍යායාත්මකව ප්‍රාන්ත සහ කලාප ආණ්ඩුවල වගකීමක් ලෙස වුවු ද පාසල් සඳහා ප්‍රතිපත්ති සහ වැඩසටහන් ඔස්ට්‍රේලියානු ජාතික රජය සතු අතර එය සම්මුතිගත ප්‍රමුඛතා සහ උපාය මාර්ග සඳහා සහාය වීමට රාජ්‍ය සහ රාජ්‍ය නොවන පාසල් බලධාරීන්ට කැපීපෙනෙන අරමුදල් සපයනු ලබයි. සියලු ප්‍රාන්ත කලාප සහ ඔස්ට්‍රේලියානු රජය මෙන් ම නවසීලන්ත අධ්‍යාපන අමාත්‍යවරුන්ගෙන් සැදි කවුන්සලයක් හරහා ජාතික මට්ටමේ උපාය මාර්ගික ප්‍රතිපත්ති සම්බන්ධීකරණය කරන අතර බෙදා හදා ගන්නා ලද අරමුණු සහ ලැදියාවන් පිළිබඳ ජාතික එකඟතා හුවමාරු කර ගනු ලබයි. (MCEETYA, 2003 a)

ජාතික ප්‍රමිත ලකුණු සහ වාර්තාකරණය පිළිබඳ නිශ්චය කරන ලද න්‍යාය පත්‍රයක් සමඟ ගුණාත්මක ඉගැන්වීම පාසල් යාම සම්බන්ධ ඔස්ට්‍රේලියානු රජයේ මැදිහත් වීම වෙනුවෙන් ශක්තිමත් ප්‍රමුඛතාවක් බවට පත්ව ඇත. කෙසේ වෙතත්, ගුණාත්මක බව (තත්ත්වය) යනුවෙන් නිශ්චිතව ම අදහස් කරන්නේ කුමක් ද යන්න පිළිබඳ පාසල් ක්ෂේත්‍රය තුළ ආරෝවන් සහ විවාදයන් මතුව තිබේ. බොහෝ ගුරුවරුන් මෙහි දී ''අධ්‍යාපනය ඇතුළු පෞද්ගලික සහ රාජ්‍ය අංශවල ගෝලීය ප්‍රතිපත්තිමය කතිකාවක් බවට ගුණාත්මක බව පත්ව ඇති බවත් අධ්‍යාපනයේ ගුණාත්මක බව පිළිබඳ බොහෝ ප්‍රතිපත්ති වගවීමේ යාන්ත්‍රණයට එකතු වන බවත්'' (110 පි.) යන විඩොවිච් සහ පෝටර්ගේ (2004) නිරීක්ෂණය බෙදා හදා ගනී. ප්‍රධාන ඔස්ට්‍රේලියානු අධ්‍යාපන පර්යාය පද කෝෂය පෙන්වා දෙනුයේ මෙම ක්ෂේත්‍රයේ යෙදුම්වල පරස්පර විරෝධී පරාසයක් පවත්නා බවය. එනම්, ගුරු ඵලදායිත්වය, අධ්‍යාපනික වගවීම, තත්ත්ව පාලනය, විශිෂ්ට ව්‍යවහාර, ප්‍රමිතලකුණු සහ සමස්ත තත්ත්ව කළමනාකරණය යනාදී වශයෙනි. Sach (1994) ගුණාත්මක බව (තත්ත්වය) පිළිබඳ යෙදුම්වල පරාසය ප්‍රධාන ප්‍රවර්ග දෙකකට වෙන් කරයි. එනම්, තත්ත්ව සහතිකය සහ තත්ත්ව වර්ධනය යනුවෙනි. බාහිර හා ප්‍රමාණාත්මක වගවීම තත්ත්ව සහතිකයට ඇතුළත් වේ. මෙහි ඇත්තේ පාලනයේ, පැවතීමේ සහ පහසුකම් පරිපාලන ව්‍යුහයේ සේවකයා විසින් මෙහෙයවන කාර්යාවලියකි. එමෙන් ම එය සමපදස්ථ ඇගයීම් සහ සාර්ථකත්වය පිළිබඳ ගුණාත්මක දර්ශක භාවිත කරයි. තත්ත්ව සහතික කිරීම පාලනය පිළිබඳ වූවක් වන අතර තත්ත්ව වර්ධනය සහභාගීවන්නන් සවිබල ගැන්වීමක් බව Sach නිගමනය කරයි. ඔස්ට්‍රේලියානු ගුරු වෘත්තිය ගුණාත්මක වර්ධනය ආමන්ත්‍රණය කිරීම සහ සහභාගීවන්නන්, රජයේ ප්‍රතිපත්ති සහ මුල පිරීම් සවිබල ගැන්වීම සඳහා තත්ත්ව සහතික කිරීම හා සාර්ථකත්වය පිළිබඳ ප්‍රමාණාත්මක දර්ශක මැනීම වෙත නැඹුරු වීම සැකයක් දනවයි.

ප්‍රතිපත්තිමය ප්‍රයත්නයන් සහ මූල්‍යමය ආධාර මෙහෙයවනුයේ කවර දිශාවකට ද යන්න රජයේ දෘෂ්ටිවාදයේ සහ අභිප්‍රායේ වඩාත් ස්පර්ශනීය දර්ශකය වේ. ප්‍රාරම්භක ගුරුවරුන් සඳහා ජාතික නිපුණතා රාමුව සමඟ 1996 දී පාසල් සඳහා ගුණාත්මක න්‍යායපත්‍රයේ පළමු පියවර තබන ලදී. මෙය ජාතික වශයෙන් ගුරුවරුන් සඳහා මූලික සුදුසුකමක් ස්ථාපිත කිරීමටත් ප්‍රාන්ත සහ කලාප හරහා සැහැල්ලු බව වර්ධනය කිරීමටත් ගත් ප්‍රයත්නයකි. මෙම වදන් මාලාව පිළිබඳ මෙන් ම සිතීම, නිර්මාණශීලීත්වය, සහ ප්‍රතිභාමය අංග පිළිබඳ නෛසර්ගික ඉගැන්වීම් ක්‍රම යොදා ගත නොහැකි නිපුණතාවලට ඉගැන්වීමේ සංකීර්ණ කාර්යය ලඝු කිරීමට ගන්නා උත්සාහයේ අනතුර වෘත්තීය සහ ගුරු සංගම් මතු කර ඇත. 2000 දී ඔස්ට්‍රේලියානු රජයේ ගුණාත්මක ගුරු ව්‍යාපෘතිය සාක්ෂරතාව, අංක හැකියාව, ගණිතය, විද්‍යාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, පාසල්වල වෘත්තීය අධ්‍යාපනය, ජාතික සුරක්ෂිත පාසල් රාමුව සහ වෘත්තීය ප්‍රමිති යන ජාතික ප්‍රමුඛතා ක්ෂේත්‍රවල පර්යේෂණ සහ ගුරු වෘත්තීය සංවර්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීම ආරම්භ කෙරිණි.

2001 ජූලි මාසයේ දී අමාත්‍ය කවුන්සලය විසින් ගුරු වෘත්තියේ තත්ත්වය සහ ගුණාත්මක බව වර්ධනයට ජාතික සහයෝගිතාව ලබා ගැනීමට ගුරු තත්ත්වය සහ අධ්‍යාපනික නායකත්ව කාර්යසාධන බලකායක් ස්ථාපිත කරන ලදී. 2003 නොවැම්බර් දී මෙම කාර්යසාධක බලකාය 'ගුරුවරුන්ගේ වෘත්තීය ප්‍රමිති සඳහා ජාතික රාමුව' සම්පාදනය කළේය. (MCEETYA, 2003 b) මෙම රාමුව වටා ඇති සාකච්ඡා සහ තර්කයන් වෘත්තීය ප්‍රමිතිවල ප්‍රතිලාභ පිළිබඳ සිත් ගන්නා ප්‍රකාශයන් ගණනාවක් නිමවයි. Lane (2001) විශ්වාස කරනුයේ ''ගුරුවරුන් සඳහා වන වෘත්තීය ඉගැන්වීම් ප්‍රමිතිවලින් විශිෂ්ට පිළිගැනීම, වර්ධිත අවබෝධය, වෘත්තිය වෙත ගුණාත්මක පිවිසුම, ගුණාත්මක බව වෙත විශිෂ්ට අවධාරණය, ප්‍රත්‍යවේක්ෂණය සහ ඇගයීම වෙත විශිෂ්ට අවධාරණය, වෘත්තීය සංවර්ධනය වෙත සමෝධානික එළඹුම'' අදහස් වන්න ඇති බවයි. ඉගැන්වීමේ ගුණාත්මක බව සහ දැනුම (ඔස්ට්‍රේලියාවේ ගුරුවරුන්ගේ), කුසලතා හා වටිනාකම් සහ ව්‍යවහාරයන් ශිෂ්‍ය සාධනය වර්ධනය කිරීම සඳහා කේන්ද්‍රීය සාධක වන බව මෙම රාමුව පිළිබඳ ලේඛනය පිළිගනී. කෙසේ වෙතත්, අධ්‍යාපනික සාධනයේ ශිෂ්‍ය මට්ටම් වර්ධනය කිරීම සඳහා කේන්ද්‍රීය සාධක වන බව මෙම රාමුව පිළිබඳ ලේඛනය පිළිගනී. කෙසේ වෙතත්, ''අධ්‍යාපනික සාධනයේ ශිෂ්‍ය මට්ටම් වර්ධනයට මග පෙන්වන ප්‍රකාශිත සහ ආරක්ෂාකාරී ප්‍රමිති හරහා පාසල් අධ්‍යාපනයේ දී මහජන විශ්වාසය වැඩි දියුණු කළ හැකිය සහ ඒ හරහා කාර්යක්ෂමතාව, ඵලදායිත්වය සහ පාසල් යාමේ සාධාරණත්වය මැනිය හා ඇගයිය හැකිය'' වැනි එහි ඇතුළත් ප්‍රකාශවලින් මෙම රාමුව තත්ත්ව සහතික කිරීමේ දැක්ම ආමන්ත්‍රණය කිරීමට උත්සාහ කරන බවට සැකයක් නොමැත. (MCEETYA, P.1)

අනතුරුව 2004 දී 'ගුරු වෘත්තිය මගින් ගුරු වෘත්ති සඳහා' ක්‍රියා කිරීමටත් ඔස්ට්‍රේලියාව පුරා ගුරුවරුන්ගේ සහ පාසල් නායකයන්ගේ තත්ත්වය, ගුණාත්මක බව සහ වෘත්තීයවේදිත්වය ඉහළ නැංවීමටත් ඔස්ට්‍රේලියානු රජයේ අරමුදල් මත ගුණාත්මක ඉගැන්වීම් සහ පාසල් නායකත්වය පිළිබඳ ජාතික ආයතනයක් ස්ථාපිත කරන ලදී. වෘත්තියේ කාර්යයන්ට එහි වරම ලබා දී ඒ වෙනුවෙන් සැබැවින් ම ක්‍රියා කිරීමේත් රජයේ අරමුදල් මත යැපීමේත් දුෂ්කරතාව ආයතනයට සම්බන්ධ වූවන් විසින් පිළිගත් අභියෝගයකි. වෘත්තීය ප්‍රමිති සහ පිළිගැනීම, වෘත්තීය ඉගෙනුම සහ පාඨමාලා පිළිගැනීම, පර්යේෂන හා සන්නිවේදනය සහ වෘත්තීය ප්‍රවර්ධනය යන එහි ප්‍රධාන කාර්යයන් හතරෙන් දෙකක් පැහැදිලිව ම තත්ත්ව සහතික කිරීමේ රඳා සිටින බව දිස් වේ. 2005 අප්‍රියෙල් මාසයේ දී එවකට සිටි අධ්‍යාපන අමාත්‍යවරයා ගුණාත්මක ඉගැන්වීම් වැඩසටහන් සඳහා අඛණ්ඩව අරමුදල් සැපයීමටත් ගුණාත්මක ඉගැන්වීම් සහ පාසල් නායකත්වය (මෙය 2005 දී ඔස්ට්‍රේලියා ඉගැන්වීම යනුවෙන් යළි නම් කෙරිණ.) පිළිබඳ ජාතික ආයතනයට තවත් වසර හතරක් සඳහා අරමුදල් සැපයීමටත් පොරොන්දු විය. 2000 සිට ඔහුගේ රජය විසින් ගුණාත්මක ඉගැන්වීම සඳහා ඇ.ඩො. මිලියන 300ක් වැය කිරීම සැමරීමේ Nelson (2005) මෙසේ පැවසීය. ''ගුරුවරුන්ගේ තත්ත්වය, වෘත්තීයවේදිත්වය සහ ගුණාත්මක බව වර්ධනය කිරීම පාසල් සම්බන්ධයෙන් රජයේ ඉහළ ම ප්‍රමුඛතාව වේ. අපගේ දරුවන්ගේ අධ්‍යාපනික ප්‍රතිඵලවලට බලපාන වඩාත් වැදගත් ම සාධකය ගුණාත්මක ඉගැන්වීම වන අතර ඉගෙනුම් ඵලවල දී විචිධත්වයෙන් 60% ක් පමණ ඉහළ මට්ටමකට එය හේතු කාරක වේ.''

රජයේ ක්‍රියාමාර්ගයට සමාන්තරව ගමන් කිරීම ගුරුවරුන්ගේ වෘත්තීයවේදී සංවිධානවල මෙන් ම වෘත්තීය ප්‍රමිති පිළිබඳ දැනුම වර්ධනය කිරීමටත් ගුරු වෘත්තියේ ප්‍රමුඛතා ලේඛනගත කිරීමටත් ජාතික රැස්වීම් සංවිධානය කළ ඔස්ට්‍රේලියානු අධ්‍යාපනඥයන්ගේ පාසල් ද ක්‍රියාකාරකමකි. ඔස්ට්‍රේලියානු රජයේ

ගුණාත්මක ගුරු ව්‍යාපෘතිය විසින් අනුග්‍රහය සැපයූ වෘත්තීයවේදී අධ්‍යාපන සංගම් රැසක් ශික්ෂණයට විශේෂිත වූ ඉගැන්වීම් ප්‍රමිති පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන කාර්යයේ දැනටමත් නියැළී සිටියහ. ඔස්ට්‍රේලියානු ගණිත ගුරුවරුන්ගේ සංගමය (2002) වෘත්තීයවේදී දැනුම, වෘත්තීයවේදී ආකල්ප සහ වෘත්තීයවේදී ව්‍යවහාරය යන ඉසව් තුන තුළ 'විශිෂ්ට ගණිත ගුරුවරුන්' පැහැදිලි කරන ප්‍රමිති දහයක් ප්‍රතිලේඛනගත කර ඇත. ඔස්ට්‍රේලියානු විද්‍යා ගුරුවරුන්ගේ සංගමයේ (2001) 'ඉහළ නිපුණත්වයක් සහිත විද්‍යා ගුරුවරුන් සඳහා වන වෘත්තීයවේදී ප්‍රමිති' පරික්ෂාවට ලක් කෙරිණි. ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා වන ඔස්ට්‍රේලියානු සංගමය (2001) ඔස්ට්‍රේලියාවේ ඉංග්‍රීසි සාක්ෂරතා ගුරුවරුන් සඳහා ප්‍රමිතs (STELLA) නමින් ගැඹුරු ලේඛනයක් සහ වෙබ් අඩවියක් සැකසීය. මනා ඉංග්‍රීසි/සාක්ෂරතා ගුරුවරුන් විශ්වාස කරන, දන්නා සහ ඔවුනට කළ හැකි දෑ පැහැදිලි කිරීමට එයින් උත්සාහ කෙරේ. මෙම සෑම ව්‍යාපෘතියක් ම ඉහළ නිපුණත්වයකට හෝ විශිෂ්ටත්වයකට පත් වීමට කැමති ගුරුවරුන්ට අනුප්‍රාණය සපයන තත්ත්ව වර්ධන ක්‍රියාකාරකම් ලෙස පැහැදිලිව අදහස් කළ බව මෙහි දී සඳහන් කරනු වටී.

ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා ප්‍රමිතියක් ව්‍යාපෘතිය 2002 දී ඔස්ටේලියානු අධ්‍යාපනඥයන්ගේ පාසලේ පැවති වෘත්තීය අධ්‍යාපනඥයන්ගේ ජාතික රැස්වීමේ දී කාර්යසාධක බලකා නියෝජිතයෙකු විසින් ඉදිරිපත් කිරීමෙන් පසු 2002 අප්‍රියෙල්හි ALIA, ASLA ඒකාබද්ධ කාර්යසාධක බලකාය විසින් ප්‍රථමයෙන් යෝජනා කරන ලදී. මෙම ඒකාබද්ධ කාර්යසාධක බලකාය නිර්මාණය කරන ලද්දේ ඔස්ට්‍රේලියානු පුස්තකාල හා තොරතුරු සංගමය (ALIA) සහ ඔස්ට්‍රේලියානු පාසල් පුස්තකාල සංගමය (ASLA) අතර 2001 හවුල්කාර ගිවිසුමක කොටසක් ලෙසය. (ASLA) සහ ALIA, 2001 b, Sharing the Future) එය පාසල් ප්‍රජාව තුළ පුස්තකාල හා තොරතුරු සේවා සහ කාර්යය මණ්ඩල භූමිකා පැහැදිලි කිරීම සහ ප්‍රවර්ධනය කිරීම, සුදුසකම් ලත් ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා රැකියා සහ වෘත්තීය ගමන් අවස්ථා ගවේෂණය කිරීම, සංවිධාන දෙක තුළ ප්‍රකාශන වැඩසටහන් සහ වැඩිදුර සහයෝගිතාව සඳහා අවස්ථා විමසීම, සහ දැනුමෙහි යාවත්කාලීන බව සහ විශිෂ්ට ව්‍යවහාර ක්‍රියාත්මක කිරීම සඳහා වෘත්තීය සංවර්ධන ප්‍රමුඛතා හඳුනා ගැනීම ඇතුළු පොදු ප්‍රමුඛතා ආමන්ත්‍රණය කිරීම සඳහා වූවක් විය. වෘත්තීය ඉගැන්වීම් ප්‍රමිති ව්‍යාපාරය මෙම සියලු ප්‍රමුඛතා හඹා යාමට අනගි මාවතකි.

මෙම ප්‍රමිති ව්‍යාපෘතියේ මුල් අරමුණ වූයේ ඔස්ට්‍රේලියාවේ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා ප්‍රමිති ප්‍රකාශයක් සංවර්ධනය කිරීම, බෙදා හැරීම සහ ප්‍රවර්ධනය කිරීමය. එය ඔස්ට්‍රේලියාවේ වෘත්තීය ව්‍යවහාරයෙහි යෙදෙන ගුරු පුස්තකාලයාධිපතීන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප පැහැදිලි කරයි. මෙම ප්‍රකාශය ඔස්ට්‍රේලියානු ගුරු පුස්තකාලයාධිපතීන්ට අනුප්‍රාණය සපයන ඉලක්ක නියෝජනය කළ යුතුය; අඛණ්ඩ වෘත්තීය ව්‍යවහාරය දැනුවත් කළ යුතුය; ගුරු පුස්තකාලයාධිපතීන්ගේ පූර්ව සේවා සහ අඛණ්ඩ අධ්‍යාපනය සඳහා පදනමක් සැපයිය යුතුය. (Mitchell, 2003) මෙම ව්‍යාපෘතියේ අභියෝගය වූයේ වෘත්තීය ව්‍යවහාරය වර්ධනය කිරීමට සහ සිසු ඉගෙනුම් ප්‍රතිඵල ඉහළ නැංවීමට ඔස්ට්‍රේලියාවේ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා විශිෂ්ටත්වයේ ප්‍රමිති පිළිබඳ පොදු සම්මුතියක් සාක්ෂාත් කර ගැනීමටය. ගුරු පුස්තකාලයාධිපතීන් ප්‍රාන්ත, කලාප හෝ ජාතික මට්ටමේ දී සැකසූ සුවිශේෂ ඉගැන්වීම් ප්‍රමිතිවලට පාර්ශ්වයක් විය යුතු බව ව්‍යාපෘති කණ්ඩායම් පිළිගැනීම විය. කෙසේ වෙතත්, ගනිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි වෘත්තීයවේදී සංගම් මෙන් සුවිශේෂ ඉගැන්වීම් දැනුම සහ කුසලතාවලට අමතරව ගුරු

පුස්තකාලයාධිපතීන්ට අවශ්‍ය දැනුම, කුසලතා සහ නිරත වීම් නිර්වචනය කිරීමට මෙම කණ්ඩායම උත්සාහ කරයි.

වෘත්තීයවේදී සංවිධාන ප්‍රමිති සංවර්ධනය පිළිබඳ උනන්දුවක් දැක් වූ මෙම කාලය ගුරු පුස්තකාලයාධිපතීත්වය කෙතරම් දුරට විද්වත් වෘත්තියක් ද පිළිබඳ සාහිත්‍යයේ ඇති වූ විවාද සමඟ සමපාත විය. (Bundi, 2001; Harvey, 2001; Mitchell, 2002 a; Morizio & Henri, 2003; Shannon, 2002) වෘත්තියක් ලෙස ගුරු පුස්තකාලයාධිපතීත්වය තරුණය. Australian Libray Journal හි පළ වූ පාසල් පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ ස්වකීය විශිෂ්ට ඓතිහාසික දැක්මේ දී ඇය මෙම වෘත්තිය 1966 ආරම්භ වූවක් බව සඳහන් කරයි. ඒ පාසල් පුස්තකාල සඳහා ප්‍රමිති සහ අරමුණුඃ අවම ප්‍රමිති සහ උචිත අරමුණු වෙත නියමුවන් යන පාසල් පුස්තකාල සංගමයේ ළමා පුස්තකාල අංශයේ පාසල් පුස්තකාල කමිටුවේ ප්‍රකාශනයක් සමඟිනි. ඔස්ට්‍රේලියා වෘත්තීන් (1997) විසින් වෘත්තීය අර්ථ දක්වනුයේ මෙසේය. ''ආචාරධාර්මික ප්‍රමිකි පිළිපදින, ඒවා අඛණ්ඩව අනුගමනය කරන උසස් මට්ටමේ පර්යේෂණ, දැනුම හා කුසලතා වෙතින් ව්‍යුත්පන්න පුළුල්ව පිළිගත් ඉගෙනුම් දේහයකින් අත්පත් කර ගත් විශේෂ දැනුම හා කුසලතා සහිත යැයි පොදු ජනයා විසින් පිළිගත් පුද්ගලයන්ගේ ශික්ෂිත කණ්ඩායමක් සහ අන්‍යයන්ගේ රුචිකත්වය වෙනුවෙන් මෙම දැනුම සහ මෙම කුසලතා ව්‍යවහාර කිරීමට සූදානම් පුද්ගලයන් වේ.'' කාර්යසාධක බලකායේ සාමාජිකයන් කටයුතු කළේ ගුරු පුස්තකාලයාධිපතීන් යනු ගුරුවරයාගේ සහ පුස්තකාලයාධිපතිගේ එකතුවට වැඩි යමක් බවට වන තර්කාංශයේ සිටය. නියත ලෙස සුවිශේෂ වූ කුසලතා සහ දැනුම කට්ටලයක් පර්යේෂණවලින් මතු වූ අතර එය ගුරු පුස්තකාලයාධිපතීන් නියෝජනය කෙරිණි. මෙම ව්‍යාපෘතියේ කාර්යය වූයේ එය නිර්වචනය කිරීමය.

ALIA/ASLA ප්‍රමිති ව්‍යාපෘතිය ආරම්භ වූයේ සාහිත්‍ය විමර්ශනයක් සමඟයඃ මෙය අධ්‍යාපනයට සම්බන්ධ අනෙකුත් වෘත්තීයවේදී සංවිධානවල කාර්යයන් වෙත නියත යොමුවක් සහිතව ජාත්‍යන්තර වශයෙන් ඉගැන්වීම් සහ පුස්තකාලයාධිපතිත්ව ප්‍රමිති මුලපිරීම් සහ පවත්නා ප්‍රමිති ලේඛන පිළිබඳ විමසුමකි. ඉගැන්වීම් වෘත්තියේ දැක්වෙන රාමුවට අමතරව වෘත්තියක් ලෙස ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ සංකල්පයට සහාය වූ පවත්නා ලේඛන ගණනාවක් ALIA සහ ASLA සතුව තිබිණි. ගුරු පුස්තකාලයාධිපති භූමිකා ප්‍රකාශය සහ පාසලෙහි ඵලදායී පුස්තකාල හා තොරතුරු සේවා සැපයීමේ විශේෂිත දර්ශක ප්‍රධාන ප්‍රතිපත්ති ප්‍රකාශනය වන අනාගතය සඳහා ඉගෙනුමඃ පාසල තුළ තොරතුරු සේවා සංවර්ධනය (2001 a) හි ඇතුළත් වේ. ALIA (2003) ප්‍රකාශනයක් වන පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයඃ හර දැනුම, කුසලතා හා ආකල්ප යන්නෙහි පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ සේවය කරන්නවුන් සඳහා හර දැනුම, ආකල්ප සහ කුසලතා ඉදිරිපත් කරයි. එමෙන් ම ALIA හර වටිනාකම් ප්‍රකාශයක් (2002) සහ වෘත්තීමය චර්යා පිළිබඳ ප්‍රකාශයක් (2001) සපයයි. ALIA සහ ASLA තමන්ගේ ම වූ ප්‍රමිති ලේඛනයක් පළ කිරීම එහි විශ්වසනීයත්වය පිළිබඳ ගැටලුවක් මතු කරන්නේ ද සහ මෙම ලේඛනයේ බලපෑම පහළ දමන්නේ ද යන්න සම්බන්ධයෙන් ගැටලු පැවති හෙයින් බාහිර උපදේශකයෙකු යොදා ගැනීමේ ප්‍රතිලාභ ව්‍යාපෘතියේ මුල් අවධියේ ප්‍රශ්නයක් විය. ගුණාත්මක ගුරු ව්‍යාපෘතිය හරහා අරමුදල් සපයා තිබුණ ද ඔස්ට්‍රේලියානු අධ්‍යාපන පර්යේෂණ කවුන්සලය සහ විශ්වවිද්‍යාලයක් විසින් පර්යේෂණයක් පවත්වා තිබුණ ද පවත්නා ඔස්ට්‍රේලියානු ගුරු ප්‍රමිති සියල්ල ම පළ කර තිබුණේත් අදාළ වෘත්තීයවේදී සංගම් විසිනි. මෙම අරමුදල්වලට ප්‍රවේශය නොමැතිව අනෙකුත් සංගම් විසින් භාවිත කළ උපදේශකයෙකු සමඟ සාකච්ඡා

පැවැත්වීමෙන් තොරව කාර්යසාධන බලකායෙන් ව්‍යාපෘතිය අඛණ්ඩව කළමනාකරණය කිරීමට තීරණය කෙරිණි. ප්‍රමිතිවල දිග පළල සහ ආකෘතිය සැලකීමේ දී අනෙකුත් වෘත්තීමය ප්‍රමිති ලේඛන සමඟ ව්‍යුහාත්මක අනුකූලතාවයක් පැවතිය ද ආඛ්‍යානමය ලේඛනයකට වඩා ප්‍රමිති ලේඛනයේ සංක්ෂිප්ත ප්‍රකාශ ආකෘතියකට කැමැත්ත දැක්වීමට කාර්යසාධන බලකාය එකඟ විය. අනාගතය සඳහා ඉගෙනුම (2001 a ) ප්‍රකාශනය මේ සඳහා විවරණ මාදිලියක් සැපයීය. එහෙයින් මෙම ලේඛනය පිටු හතරකින් පළ කිරීමට තීරණය කෙරිණි.

කාර්යසාධන බලකා සාමාජිකයන් ටෙලි සම්මන්ත්‍රණ සහ ඉලෙක්ට්‍රොනික තැපෑල හරහා මූලික ද්‍රව්‍ය සම්බන්ධ වැඩ කටයුතු සිදු කළ අතර ක්‍රමයෙන් සම්මුතිය මගින් ව්‍යුහය, අන්තර්ගතය සහ වචන භාවිතය පිරිපහදු කරන ලදී. ALIA පාසල් අංශ කමිටුව, ASLA කවුන්සලය සහ විශේෂඥ අධ්‍යාපන මණ්ඩලයක් කෙටුම්පත විමර්ශනය කරමින් තෙවන කෙටුම්පතට පසු 2003 ජූලි මාසයේ දී උපදේශකත්ව අවධියක් ඇරඹිණි. මෙම කණ්ඩායම් පොදුවේ ධනාත්මක ප්‍රතිචාර මෙන් ම වර්ධනය සඳහා යෝජනා ද ඉදිරිපත් කළහ. ප්‍රාන්ත හා කලාප පාදක උපදේශකත්වයන් වැඩමුළු ආකෘතියක් ගත් අතර ඊට විදුහල්පතිවරුන්, අධ්‍යාපන පීඨ සහ පුස්තකාල පාසල්වල විද්වතුන්, වෘත්තීය සමිති, අනෙක් වෘත්තීයවේදී සංගම් සහ පද්ධති හා අංශ ප්‍රතිපත්ති සම්පාදකයන් යන ප්‍රධාන හවුල්කරුවෝ සහභාගී වූහ. මුහුණට මුහුණ වැඩසටහන් ශක්‍යතාවෙන් යුක්ත වූ අතර උපදෙස් සහ අදහස් ලබා ගැනීම සඳහා සරලව කෙටුම්පතේ පිටපත් යැවීමට වඩා කැපී පෙනෙන ලෙස බෙහෙවින් ඵලදායී බව තහවුරු විය. 2003 ASLA ජාතික සමුළුවේ අවසන් වැඩමුළු සැසියට පසු අවසන් සංස්කරණය අනුමැතිය සඳහා ASLA කවුන්සලයට සහ ALIA මණ්ඩලයට ඉදිරිපත් කෙරිණි. ප්‍රමිති ලේඛනය සැලසුම් කිරීම සහ ප්‍රකාශනය 2004 අග භාගයේ දී සම්පූර්ණ කරන ලද අතර 2005 අප්‍රියෙල් 13 දින කැන්බරාහි පැවති සමුළුවේ දී ගුණාත්මක ඉගැන්වීම සහ පාසල් නායකත්වය පිළිබඳ ජාතික ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී විසින් ජාතික වශයෙන් එළි දක්වන ලදී.

ව්‍යාපෘතිය පුරා බාහිර සහාය තත්ත්ව වර්ධන දර්ශනයක් අනුගත කිරීමට පක්ෂපාතීව පැවතිණි. එහෙයින් කාර්යසාධන තක්සේරුව හෝ බාහිර විමර්ශනය සඳහා මෙවලම් සැකසීමට හෝ ප්‍රවේශ මට්ටම් ප්‍රමිති (මුල් ව්‍යාපෘති විස්තරය පැවතිය ද) නිර්වචනය කිරීමට හෝ උත්සාහයක් නොදැරිණි. මෙම ප්‍රමිති, ඔස්ට්‍රේලියාවේ ගුරු පුස්තකාලයාධිපතිවරයෙක් නිර්වචනය කරන ද්විත්ව සුදුසුකම් දැනටමත් දරන අත්දැකීම් සහිත වෘත්තිකයෙකු පැහැදිලි කරයි. එමෙන් ම මෙම ප්‍රමිති විශිෂ්ට හෝ ඉහළ නිපුණතාවක් සහිත ගුරු පුස්තකාලයාධිපතිවරුන්ට ලැජ්ජාවකින් තොරව යොමු කළ හැකි අනුප්‍රාණිත ප්‍රකාශයක් වීමට ද අපේක්ෂිතය. වෘත්තීය ඉගෙනුමට මග පෙන්වීමටත් සිසු ඉගෙනුම වර්ධනයටත් වෘත්තීය වෙනුවෙන් වෘත්තීයවේදීත්වය විසින් මෙම ප්‍රමිති සංවර්ධනය කරන ලදී. වෘත්තීය දැනුමෙහි (ගුරු පුස්තකාලයාධිපති දන්නේ කුමක් ද?), වෘත්තීය ව්‍යවහාරය (ඔවුන් කරන්නේ කුමක් ද?) සහ වෘත්තීය කැපවීම (ඔවුන්ගේ ආකල්ප, සේවයට කැපවීම සහ වෘත්තිය සමඟ නිරත වීම) පුළුල් රාමුව තුළ ගුරු පුස්තකාලයාධිපත්වරුන්ගේ සංකීර්ණ කාර්යය සංක්ෂිප්ත කිරීමට උත්සාහ කරන ප්‍රමිති 12කි. ප්‍රකාශයන්ගේ ධුරාවලිගත පිළිවෙළක් අපේක්ෂා නොකෙරේ. ඊට වඩා එය ඔවුන්ගේ සන්දර්භයට ගැළපෙන දැනුම, කුසලතා සහ ආකල්ප එක් කරන වෘත්තීමය වර්ණාවලියකින් සිතුවම් කරන පළපුරුදු වෘත්තිකයෙකු පිළිගැනීමට ලක් කරයි. මෙම ප්‍රමිති 12 ම ඒවා පැහැදිලි කරන කරුණු තුනක් හෝ හතරක් සපයයි.

**වෘත්තීය දැනුම**

විශිෂ්ට ගුරු පුස්තකාලයාධිපතීන්

1.1 යාවජීව අධ්‍යාපනයේ මූලධර්ම අවබෝධ කර ගනී.

1.2 විෂයමාලා ක්ෂේත්‍ර සහ සංවර්ධන මට්ටම් පුරා ඉගෙනුම සහ ඉගැන්වීම පිළිබඳ දැනුවත්ය.

1.3 පාසල් ප්‍රජාව සහ විෂයමාලාව පිළිබඳ මනා අවබෝධයකින් යුක්තය.

1.4 තොරතුරු, සම්පත්, තාක්ෂණය සහ පුස්තකාල කළමනාකරණය පිළිබඳ විශේෂඥ දැනුමක් තිබේ.

**වෘත්තීය ව්‍යවහාරය**

විශිෂ්ට ගුරු පුස්තකාලයාධිපතීන්

2.1 සහායශීලී, ගුරු තොරතුරුවලින් පොහොසත් ඉගෙනුම් පරිසරයක් තුළ ඉගෙනුම්කරුවන් නිරත කරවන අතර ඔවුනට අභියෝග සපයයි.

2.2 මාරු කළ හැකි තොරතුරු සාක්ෂරතා සහ සාහිත්‍ය එල අන්තර්ගත විෂයමාලා වැඩසටහන් සැලසුම් කරන අතර ඊට සම්පත් සපයයි.

2.3 ජාතික ප්‍රමිති සමඟ අනුකූල වන නිදර්ශනාත්මක පුස්තකාල හා තොරතුරු සේවා සපයයි.

2.4 වෘත්තීය ව්‍යවහාරය දැනුවත් කිරීමට සිසු ඉගෙනුම් සහ පුස්තකාල වැඩසටහන් හා සේවා ඇගයීමට ලක් කරයි.

**වෘත්තීය කැපවීම**

විශිෂ්ට ගුරු පුස්තකාලයාධිපතීන්

3.1 යාවජීව ඉගෙනුම ආදර්ශනය කරන අතර ප්‍රවර්ධනය කරයි.

3.2 අධ්‍යාපනය සහ පුස්තකාලයාධිපතීත්වයේ මූලධර්මවලට කැප වෙයි.

3.3 පාසල් සහ වෘත්තීය ප්‍රජාවන් තුළ නායකත්වය විදහා දක්වයි.

3.4 අධ්‍යාපන සහ පුස්තකාල වෘත්තීය ජාල තුළ සක්‍රීයව සහභාගී වෙයි.

**ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා වෘත්තීය විශිෂ්ටත්වය පිළිබඳ ප්‍රමිති (2005)**

උපදේශාත්මක ක්‍රියාවලියේ දී එය නියෝජනය කළ පුළුල් පරාසයක කණ්ඩායම් සිටිය ද, ජාතික ප්‍රමුඛතා කට්ටලයක් සහ ඉක්බිති ප්‍රමිති පිළිබඳ සාකච්ඡා කිරීමේ දී විස්මිත ලෙස අභියෝග කීපයක් මතු විය. පාසල් පුස්තකාල සඳහා සේවා පාදක උපදේශක සේවාවන්ගේ අඩුව මීට හේතු විය හැකිය. මෙයින් අදහස් වන්නේ ගුරු පුස්තකාලයාධිපතීන් නායකත්වය සඳහා වෘත්තීයවේදී සංගම් දෙස බලා සිටීමට පුරුදු වී ඇති බවය. සඳහන්කිරීමට වඩාත් රුචිකර කරුණ වන්නේ විවාදය මතු වීමට එකම හේතුව 2.4 වගන්තියේ අන්තර්ගත ''සිසු ඉගෙනුම් ඇගයීම'' යන යෙදුම වීමය. ගුරු පුස්තකාලයාධිපතීන් බොහොමයක්, විශේෂයෙන් ද්විතීක පාසල්වල (සිසුන්ගේ වයස 11 17) ගුරු පුස්තකාලයාධිපතීහු මෙය ස්වකීය භූමිකාවේ කොටසක් ලෙස නොදුටුවහ. එහෙත් පවත්නා ආකල්පය වූයේ සිසු ඉගෙනුම ඇගයීම ගුරුවරයෙකු වීමේ අත්‍යවශ්‍ය කාර්යයක් බවත් විශිෂ්ටත්වයේ විස්තරයෙන් එය ඉවත් කිරීමෙන් ගුරු පුස්තකාලයාධිපතීන්ගේ වෘත්තීය විශ්වසනීයත්වය බරපතළ ලෙස අපකීර්තියට පත් වන බවත්ය.

2006 වසර පුරා ලිපි, සම්මන්ත්‍රණ පත්‍රිකා, සහ වැඩමුළු හරහා ගුරු පුස්තකාලයාධිපතීන්, සේවකයන්, තෘතීයික ආයතන සහ සාමාජික සංගම් එයින් ප්‍රමිති අවබෝධ කර ගැනීම සහ භාවිතය ප්‍රවර්ධනය සංගම් දෙක විසින් ම අඛණ්ඩව සිදු කරනු ඇත. වෘත්තිකයින් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය වෘත්තියක පිළිගත් සංරචකයකි. අපගේ ශල්‍ය වෛද්‍යවරුන්, දන්ත වෛද්‍යවරුන් සහ ගණකාධිකාරීන් උපාධිය ලැබීමෙන් පසු තම වෘත්තීය අධ්‍යාපනයේ අඛණ්ඩව යෙදී සිටින අප අපේක්ෂා කරන අයුරින් ගුරු පුස්තකාලයාධිපතීන් ද නවතම දැනුම සහ ව්‍යවහාරයන් සමග සිටිමින් අඛණ්ඩව වෘත්තීය ඉගෙනුමක යෙදෙනු ඇතැයි ප්‍රජාව අපේක්ෂා කළ යුතුය. ගුරු පුස්තකාලයාධිපතිත්වය විශේෂිත දැනුම, කුසලතා සහ ආකල්ප සහිත ශික්ෂණයක් නම් අපගේ වෘත්තිකයන් ස්වකීය දැනුම පවත්වාගෙනයාම සහතික කිරිමට වගකීමක් වෘත්තිකයන් ලෙස අප සතුය. වෘත්තීය සංවර්ධන යෝජනා ක්‍රමයක් ALIA ක්‍රියාත්මක කරයි. එමගින් ස්වකීය වෘත්තීය සංවර්ධන සැලසුම් ලියාපදිංචි කිරීමටත් තම දැනුම හා කුසලතා පවත්වාගෙනයාම සඳහා ක්‍රියාකාරකම්වල යෙදීමටත් වෘත්තිකයන්ට අවස්ථාව තිබේ. මෙය රාමුවක් පමණක් නොව වෘත්තිකයන් පිළිබඳ පිළිගැනීම ද සපයයි.

වෘත්තීය විශිෂ්ටත්වයේ සාක්ෂි එකතුවක් වෙත මග පෙන්වීමට ගුරු පුස්තකාලයාධිපතීන් මෙම ප්‍රමිති භාවිත කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ASLA විශිෂ්ට ව්‍යවහාර ව්‍යාපෘතියට හෝ EDNA (2006) විසින් අනුග්‍රහය සැපයූ ගුරු පුස්තකාලයාධිපතීන්ගේ ප්‍රජාව වෙත දායක වීම මගින් සහ සඟරා සහ සම්මන්ත්‍රණවලට ලිපි ලිවීම මගින් ගුරු පුස්තකාලයාධිපතීන් තමන්ගේ කතා පවසනු ඇතැයි අපි අපේක්ෂා කරමු. වෘත්තීය කාර්යසාධන ගොනු, ඉලෙක්ට්‍රොනික් ගොනු හෝ පෞද්ගලික ඉගෙනුම් සටහන් භාවිත කිරීමට සැලසුම් සකසා ඇති අතර ගුරු පුස්තකාලයාධිපතීන් සිසුන්ගේ කාර්ය සාම්පල ඉගැන්වීමට සම්බන්ධ ලේඛන, වීඩියෝපට සහ පෞද්ගලික ප්‍රත්‍යවේක්ෂණ මෙන්ම වෘත්තීය සංවර්ධනයට සහාය වන විස්තර වාර්තා කරයි. එක්සත් ජනපදයේ පවත්නා ජාතික වෘත්තීය ඉගැන්වීම් ප්‍රමිති මණ්ඩලය වැනි යමක් වර්තමානයේ ඔස්ට්‍රේලියාවේ නොපැවතිය ද උසස් නිපුණතාවක් සහිත වෘත්තිකයන් වෙනුවෙන් පිළිගැනීමේ සමාන වැඩසටහනක් හඹා යාමට ඔස්ට්‍රේලියා ඉගැන්වීම සහ ඉගැන්වීම හා පාසල් නායකත්වය සඳහා වන ජාතික ආයතනයට හැකියාව ඇත. Ingvarson, Meiers සහ Beavis (2005) අදාළත්වය, සක්‍රිය ඉගෙනුම සහ වෘත්තීය ප්‍රජාවකට අයත් වීමේ වැදගත්කම වෙත අවධානය යොමු කරමින් ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය සහ සිසුන්ගේ ඉගෙනුම් ප්‍රතිඵල අතර අභියෝගාත්මක කලාප වෙත පර්යේෂණ දියත් කර ඇත. වෘත්තීයවේදී සංවිධාන මෙම ක්ෂේත්‍රයෙහි අඛණ්ඩ පර්යේෂණවලින් ප්‍රතිලාභ ලබනු ඇති අතර

ඔවුන් උසස් වෘත්තීය තත්ත්වයන් සඳහා ස්වකීය  අපේක්ෂාවන්ගේ කොටසක් ලෙස සාක්ෂි පාදක ව්‍යවහාරයන් දිරිමත් කළ යුතුය.

ගුණාත්මක බව සහ වෘත්තීය ප්‍රමිති වෙත පවත්නා මෙම අවධානයන් සමග ඔස්ට්‍රේලියානු ගුරුවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා සම්මාන ලබා දීමේ සහ පිළිගැනීමට ලක් කිරීමේ යෝජනා ක්‍රමයකට නව උද්‍යෝගයක් නැඟ විත් ඇත. වසර කීපයක් පුරා ගුණාත්මක ගුරු සම්මානය සහ විද්‍යා සති සම්මානය සඳහා ඔස්ට්‍රේලියානු රජය අරමුදල් සපයා තිබේ. එමෙන් ම දෙමාපියන් විසින් නම් කරන සාමාන්‍ය ගුරු සම්මානයට වානිජ ශිෂ්‍යත්ව අරමුදල් අනුග්‍රාහකත්වය සපයයි. 2003 දී වසරේ ගුරු පුස්තකාලයාධිපති සම්මානයක් ආරම්භ කිරීමට වූ යෝජනාව සහ Pledge Consulting ආයතනය ඊට දැක් වූ අනුග්‍රහය ASLA සතුටින් පිළිගත්තේය. මෙම සම්මානය ශිෂ්‍ය සාධනය සහ තොරතුරු සාක්ෂරතාව පිළිබඳ ධනාත්මක බලපෑමක් සමග පාසල් පසුබිමක වෘත්තීය ව්‍යවහාරයේ යෙදෙන විශිෂ්ටතම ඔස්ට්‍රේලියානු ගුරු පුස්තකාලයාධිපති කෙනෙකු පිළිගැනීමට සහ බුහුමනට ලක් කරයි. විශිෂ්ටත්වය සැමරීමේ ක්‍රමයක් ලෙසත් ඵලදායී උපදේශන උපාය මාර්ගයක් ලෙසත් ASLA මෙම සම්මානය සලකනු ලබයි. කෙසේ වෙතත්, ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා වෘත්තීය විශිෂ්ටත්වයේ ප්‍රමිතිවල දාර්ශනික පදනම සහ අභිප්‍රාය වන්නේ සෑම ගුරු පුස්තකාලයාධිපති කෙනෙකු ම පෞද්ගලික වෘත්තීය ඉගෙනුම් සැලැස්මක් සංවර්ධනය කිරීමය. එය ආමන්ත්‍රණය කරනුයේ ඔහු හෝ ඇය අන්‍යයන් සමග සසඳන ආකාරයට වඩා, පුද්ගලයා වෘත්තීමය ලෙස ඉගෙනුම ලබන්නේ ද වර්ධනය වන්නේ ද ඔහු හෝ ඇය පසුගිය සතියට හෝ පසුගිය වසරට වඩා අද විශිෂ්ටත්වයට සමීප වී ඇත් ද යන මූලික ප්‍රශ්න වෙතය.

ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා ප්‍රමිති නම් ALIA/ASLA සම ව්‍යාපෘතිය අධ්‍යාපන සහ පුස්තකාලයාධිපතීත්වය යන ක්ෂේත්‍ර දෙකෙහිම ගුරු පුස්තකාලයාධිපතීන්, පරිපාලකයන්, ප්‍රතිපත්ති සම්පාදකයන් සහ විද්වතුන් සමග එක්ව ජාතික වෘත්තීය ප්‍රමිති සංවර්ධනය කිරීමේ වගකීම දැරීය. මෙම ප්‍රතිපත්ති සංවර්ධනය කර තිබීමෙන් හා ALIA සහ ASLA විසින් එය ප්‍රතිපත්තියක් ලෙස පිළිගෙන තිබීමෙන් ගුණාත්මකභාවය පිළිබඳ මෙම නිර්වචනය ගුරු පුස්තකාලයාධිපතීන්, තෘතියික අධ්‍යාපනය සපයන්නන්, අධ්‍යාපන ක්ෂේත්‍රය, වෘත්තීය සමිති, ගුරු පුස්තකාලයාධිපතීන්ගේ සේව්‍යයන් සහ ප්‍රජාව බෙදා හදා ගෙන සහ පිළිගෙන ඇති ප්‍රමාණය මගින් දැන් ව්‍යාපෘතියේ සාර්ථකත්වය මැනිය හැකි වනු ඇත. ප්‍රමිතිවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම, ප්‍රමිති එහි භාවිතය මධ්‍යකාලීනව ඇගයීම සහ ගුණාත්මක ගුරු ව්‍යාපෘති වෙත වත්මන් ඔස්ට්‍රේලියානු අරමුදල් සැපයීමේ ආලෝකය තුළ, පර්යේෂණ ගැටලු සහ ඔස්ට්‍රේලියාවේ ගුණාත්මක අධ්‍යාපනයේ ප්‍රධාන දායකත්වය දක්වන්නන් ලෙස අඛණ්ඩව ක්‍රියා කිරීම නිසා සිසු ඉගෙනුම වෙත ගුණාත්මක ගුරු පුස්තකාලයාධිපති විසින් කළ වෙනස ක්‍රියාත්මක කිරීමට අරමුදල් යෙදීම මෙම වෘත්තීයවේදී සංගම් දෙක විසින් අනාගතයේ දී ගනු ලබන ක්‍රියාමාර්ගවලට ඇතුළත් වනු ඇත.

**මෙම ලිපිය ජාත්‍යන්තර පාසල් පුස්තකාලයාධිපතින්ගේ සංගමය (International Association of School Librarianship - IASL) වෙතින්, ගෙවීමක් නොකර අවසර ලබාගෙන පරිවර්තනය සිදු කරන ලදී. මෙහි අන්තර්ගතය තවදුරටත් භාවිතා කිරීමට අවශ්‍ය නම්, ඒ සඳහා ජාත්‍යන්තර පාසල් පුස්තකාලයාධිපතින්ගේ සංගමයෙන් (International Association of School Librarianship - IASL) අවසර ලබාගත යුතුය.**

***References***

Australian Association for the Teaching of English. (2001). *STELLA: Standards for teachers of English and literacy in Australia.* Retrieved March 16, 2006, from: http://www.stella.org.au/

Australian Association of Mathematics Teachers. (2002). *Professional standards for excellence in the teaching of mathematics.* Retrieved March 16, 2006, from: http://www.aamt.edu.au/standards/

Australian Bureau of Statistics. (2004). *August 2004 national schools census.* Retrieved March 16, 2006, from: http://www.abs.gov.au/AUSSTATS/abs@.nsf/Lookup/4221.0Main+Features12004?OpenDocument

Australian College of Educators. (2002). *National meeting of professional educators national audit: Current developments teacher standards, quality and professionalism.* Retrieved March 16, 2006, from: http://www.austcolled.com.au/index.php?option=com_docman&task=doc_download&gid=281

Australian Library and Information Association. (2001). *Statement on professional conduct.* Retrieved March 16, 2006, from: http://www.alia.org.au/policies/professional.conduct.html

Australian Library and Information Association. (2002). *ALIA core values statement.* Retrieved March 16, 2006, from: http://www.alia.org.au/policies/core.values.html

Australian Library and Information Association. (2003). *The library and information sector: Core knowledge, skills and attitudes.* Retrieved March 16, 2006, from: http://www.alia.org.au/policies/core.knowledge.html

Australian School Library Association and Australian Library and Information Association. (2001a). *Learning for the future: Developing information services in schools* (2nd ed.). Carlton South: Curriculum Corporation.

Australian School Library Association and Australian Library and Information Association. (2001b). *Sharing the future.* Unpublished memorandum.

Australian School Library Association and Australian Library and Information Association. (2005). *Standards of professional excellence for teacher-librarians.* Retrieved March 16, 2006, from: http://www.alia.org.au/policies/teacher-librarian.standards.html

Australian Science Teachers' Association. (2002). *National professional standards for highly accomplished teachers of science.* Retrieved March 16, 2006, from: http://www.asta.edu.au/freestyler/gui/files//ASTA%20Stds%20Summary.pdf

Australian Universities Quality Agency. (2004). *AUQA Information.* Retrieved March 16, 2006, from: http://www.auqa.edu.au/aboutauqa/auqainfo/

Baldwin, P. (1991). *Higher education: Quality and diversity in the 1990s: Policy statement by the Hon. Peter Baldwin Minister for Higher Education and Employment Services.* Canberra:AGPS.

Bundy, A. (2001). Discovery and renewal for an information enabled knowledge nation. *Access, 15*(4), 7-9.

Harvey, R. (2001). Teacher librarians … Who are you? *Access, 15*(4), 10-11.

Ingvarson, L., Meiers, M., & Beavis, A. (2005). *Factors affecting the impact of professional development programs: On teachers' knowledge, practice, student outcomes and efficacy.* Retrieved March 16, 2006, from: http://epaa.asu.edu/epaa/v13n10/v13n10.pdf

Kleinhenz, E., & Ingvarson, L. (2004). Teacher accountability in Australia: Current policies and practices and their relation to the improvement of teaching and learning. *Research Papers in Education, 19*(1), 31-50.

Lane, R. (2001). The impact of standards on a beginning teacher. *Unicorn, 27*(3), 18-20.

MCEETYA (2003a). *National report on schooling in Australia.* Retrieved March 16, 2006, from: http://www.mceetya.edu.au/mceetya/anr/

MCEETYA. (2003b). *National Framework for Professional Standards for Teaching.* Retrieved March 16, 2006, from:

http://www.mceetya.edu.au/verve/_resources/national_framework_file.pdf
Mitchell, P. (2002a). A profession or a specialisation? *Access, 16*(2), 8-11.
Mitchell, P. (2002b). Sharing the future: ALIA and ASLA working together. *Access, 16*(2), 12.
Mitchell, P. (2003). *Standards for teacher librarians in Australia: Island journeys, a quest for inspiration.* Paper presented at the joint national conference of the Children's Book Council of Australia and the Australian School Library Association, Hobart.
Morizio, C., & Henri, J. (2003, August). *Education for school librarianship: Selected issues and trends.* Paper presented at the 69th IFLA General Conference and Council, Berlin.
*National Competency Framework for Beginning Teachers.* (1996). Sydney: Australian Government Publishing Service.
National Institute for Quality Teaching and School Leadership. (2005). *Business plan 2005-2007.* Retrieved March 16, 2006, from: http://www.teachingaustralia.edu.au/
Nelson, B. (2005). *$139 million boost for quality teaching in Australia.* Retrieved March 16, 2006, from: http://www.dest.gov.au/Ministers/Media/Nelson/2005/04/n1078080405.asp
Nimon, M. (2004). *School libraries in Australia.* Retrieved March 16, 2006, from: http://www.alia.org.au/publishing/alj/53.1/full.text/nimon.html
Professions Australia. (1997). *Definition of a profession.* Retrieved March 16, 2006, from: http://www.professions.com.au/definitionprofession.html
Sachs, J. (1994). Strange yet compatible bedfellows: Quality assurance and quality improvement. *Australian Universities' Review, 37*(1), 22-25.
Shannon, D. (2002). *The education and competencies of school library media specialists: A review of the literature*. Retrieved March 16, 2006, from: http://www.ala.org/ala/aasl/asslpubsandjournals/ slmrb/slmrcontents/volume5202/shannon.htm
*Teacher Librarians @ EdNA Groups*. (2006). Retrieved March 16, 2006, from: http://www.groups.edna.edu.au/course/view.php?id=5
Thomson,S., Cresswell,J., & De Bortoli,L. (2004). *PISA in brief from Australia's perspective: Highlights from the full Australian report*. Retrieved March 16, 2006, from: http://www.acer.edu.au/research/PISA/documents/PISA_Brief_screen.pdf
Vidovich,L., & Porter, P. (2004). Achieving "settlement" negotiations on new national "quality" policy for higher education in a context of globalization. *Change: Transformation in Education*, 7(1), 109-125.

*Author Note*

Pru Mitchell has worked in Australian education sector libraries since 1983. She currently divides her time between reference librarianship at the University of Adelaide and online information management at education.au, Australia's ICT in education agency. During her term as Vice President (Association Relations) of the Australian School Library Association, she was a member of the Joint ASLA-ALIA Policy Advisory Group and was actively involved in their professional standards project.

Reproduced, with permission, from *School Libraries Worldwide*, Volume 12, Issue 1, 2006, 39-49.